101

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2014

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2016 මාර්තු)

## BLE 206 - ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) අනිවාර්ය ප්‍රශ්නය හා තවත් ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

අනිවාර්ය ප්‍රශ්නය

01. " ස්ත්‍රී සහ පුරුෂ සම්බන්ධතාවලින් බිහිවන දරුවන් එම ස්ත්‍රියගේ සහ පුරුෂයාගේ දරුවන් ලෙස සමාජයේ පිළිගැනීමේ පදනම විවාහය නම් වේ."

මෙම කියමන මහනුවර යුගයේ විදේශිකයන්ගේ වාර්තාවලට අනුව විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 25)

02. අනුරාධපුර යුගයේ ශ්‍රම විභජනය, කෘෂිකර්මය පදනම් කරගත් සමාජ-ආර්ථික නිෂ්පාදන මාදිලියක් නිර්මාණය කිරීමට දායක වූ අයුරු විභාග කරන්න.

(ලකුණු 25)

03. " අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනැගීම සඳහා පුරාවිද්‍යා මූලාශ්‍රවලින් ලැබෙන පිටුවහල ඉතා වැදගත්ය." මෙම ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 25)

04. (i) අනුරාධපුර යුගයට අයත් ප්‍රධාන වැවක් පිළිබඳ සටහනක් ලියන්න.

(ii) වැවක කොටස් අසුරින් පැරණි ලංකාවේ වාරි තාක්ෂණය පිළිබඳ ඇගයීමක් කරන්න.

(ලකුණු 25)

05. කුලය සමාජ අවමානයට මෙන්ම සමාජ ප්‍රගමනයට ද යොදාගත් අයුරු අනුරාධපුර යුගයේ කුල ක්‍රමය ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 25)

06. (i) කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින් යෝජනා කළ ප්‍රධාන නිරදේශ තුනක් (03) කෙටියෙන් දක්වන්න.

(ii) එම යෝජනා පැවති නිෂ්පාදන මාදිලිය අභිබවා නව නිෂ්පාදන මාදිලියකට අවශ්‍ය ශ්‍රම බලකාය නිර්මාණයට කෙතෙක් දුරට හේතු වූයේ දැයි විශ්ලේෂණය කරන්න.

(ලකුණු 25)

* * * * *